කාර්යය පත්‍රිකාව 04

1) පන්තිය :- 06 විෂය :- ගණිතය අදාල සතිය :- 8.4

2) පාඩම හෝ ඒකකය :- සංඛ්‍යා වර්ග හා සංඛ්‍යා රටා

3) සතිය තුළ නියමිත පාඩම්වලින් ලබාගත යුතු ඉගෙනුම් ඵල :-
   - ප්‍රථමක සංඛ්‍යා සහ සංයුක්ත සංඛ්‍යා හඳුනා ගනියි.
   - ප්‍රථමක සංඛ්‍යා සහ සංයුක්ත සංඛ්‍යා ලෙස පූර්ණ සංඛ්‍යා වර්ගීකරණය කරයි.

4) ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් කෙටියෙන්
   i. 14.2 (පිටු අංක 30) හොඳින් කියවන්න
   ii. ක්‍රියාකාරකම 1 ට අදාල වගුව සම්පූර්ණ කරන්න
   iii. enenapiyasa, e-thaksalawa, ගුරු ගෙදර, පාසැල් වෙබ් අඩවි මගින් පාඩම් ලබාගෙන ඉගෙන ගන්න
   iv. 14.3 අභ්‍යාස කරන්න

5) ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත් පත්, website, LMS පාඩම් වෙනත් (online, offline, printed)
   - https:// enanapiyasa.lk/සාමාන්‍ය පාඩම්/6 ශ්‍රේණිය
   - https://www.e-thaksalawa.moe.gov.lk
   - https://wordwall.net/play/17700/838/7346

නිලධාරියාගේ නම :- W.P.S. නිමේෂ් සෙනවිරත්න
පාසල :- කෑ/මාව/ ගබ්බල සිරිසඝබෝ මහා විද්‍යාලය

ඇගයීම් පත්‍රිකාව

සංඛ්‍යාව	රූපය හා සටහන
2	1 2 — ඇදිය හැක්කේ එක් රූපයක් පමණි. 2 ප්‍රථමක සංඛ්‍යාවකි
3	1 2 3 — ඇදිය හැක්කේ එක් රූපයක් පමණි. 3 ප්‍රථමක සංඛ්‍යාවකි
4	1 2 / 3 4 — 1 2 3 4 — රූප 1 කට වඩා වැඩියෙන් ඇදීමට හැකිය. 4 සංයුක්ත සංඛ්‍යාවකි

i. ඉහත පරිදි 2 සිට 20 දක්වා ඇති සෑම සංඛ්‍යාවක්ම නිරූපණය කිරීම සඳහා ඇදිය හැකි එකිනෙකට වෙනස් සමචතුරස්‍ර හා සෘජුකෝණාස්‍ර සියල්ල අඳින්න

ii. කිසියම් සංඛ්‍යාවක් සඳහා රූප සමචතුරස්‍ර හෝ සෘජුකෝණාස්‍ර 1 ට වඩා ඇදිය හැකි නම් එම සංඛ්‍යාව සංයුක්ත සංඛ්‍යාවක් ලෙස නම් කරන්න

iii. කිසියම් සංඛ්‍යාවක් සඳහා ඇදිය හැක්කේ එක් රූපයක් පමණක් නම් එම සංඛ්‍යාව ප්‍රථමක සංඛ්‍යාවක් ලෙස නම් කරන්න

- ❖ අවධානයට

2 නැමති සංඛ්‍යාව නිරූපණය කිරීම සඳහා



ලෙස රූප දෙකක් ඇදිය හැකි වුවත් මෙම රූප දෙකම එක සමාන වේ ඒ අනුව 2 නැමති සංඛ්‍යාව නිරූපණය කිරීම සඳහා ඇදිය හැක්කේ එක් රූපයක් බව සලකන්න